ශීර්ෂය - 311 ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ සැසඳීමක් කළ නොහැක. තවද, ඒ හේතුවෙන්ම ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශද මෙම වාර්තාවෙහි ඉදිරිපත් කර නැත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධාවලට අනුකූල නොවීම

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථාවක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| චක්‍රලේඛයේ 3.3 ඡේදය ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේදී එම වත්කම්වලට අදාල ප්‍රධාන ලෙජර් ශේෂ වටිනාකම් කේවල ශේෂ සමග නොසැසඳේ නම් ජර්නල් සටහන් මගින් සංශෝධනය කළ යුතු වුවද දෙපාර්තමේන්තුවේ ප්‍රාග්ධන වැය ලෙජරය තුල ඇතුලත් රු.8,894,897 ක වියදම් මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගතකර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන අනුව ගනුදෙනු වාර්තා කළ යුතුවීම. | 2001 - ගොඩනැගිලි පිහිටි ඉඩමේ පිඹුර, සැලැස්ම, හිමිකම් සහතික නැති නිසා මූල්‍ය නොවන වත්කම් ලෙස එකතු කර නැත.<br>2002, 2003 - මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම් ගතකිරීමට කටයුතු කරයි. |

### 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2017 වර්ෂයේදී මිලදීගෙන තිබුණු එකතුව රු.5,161,274 ක කාර්යාලීය පුටු හා වැඩබිම් වෙන්කිරීම්වල පිරිවැය 2018 වර්ෂයේ අත්පත් කර ගැනීම් ලෙස ගිණුම් ගතකර තිබුණි. | 2017 වර්ෂයේදී සිදුකළ මිලදී ගැනීම් සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයට ගැලපිය යුතුවීම. | දැනට නිවැරදි කිරීම් සිදුකර ඇත. |
| (ආ) 2017 වර්ෂයේ දී නැවත තක්සේරු කරන ලද එකතුව රු.5,677,224 ක වත්කම් සමාලෝචිත වර්ෂයේ මිලදී ගැනීම් ලෙස ගිණුම් ගතකර තිබුණි. | පසුගිය වර්ෂයේ තක්සේරු කිරීම් සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයට ගැලපිය යුතුවීම. | 2017 ගිණුම්වලට ගැලපිය නොහැකි වූ බැවින් 2018 එකතුකිරීම් ලෙස සටහන් කරන ලදී. |
| (ඇ) 2017 වර්ෂයේ අවසන් ගිණුම් අනුව වැය විෂයය අංක 2502 යටතේ රු.3,832,191 ක GIS පරිගණක මෘදුකාංග ශේෂයක් පැවතියද සමාලෝචිත වර්ෂයේදී එවැනි | දෙපාර්තමේන්තුවේ වත්කම් නිවැරදිව ගිණුම් ගතකල යුතුවීම. | මූල්‍ය නොවන වත්කම් සිගාස් වැඩසටහනට ඇතුළත් කර නැත. |

| | | |
|---|---|---|
| පරිගණක මෘදුකාංග වත්කම් ශේෂයක් ගිණුම්වල ඇතුළත් කර නොතිබුණි. | | |
| (ඇ) 2018 වර්ෂයේ ජංගම නොවන වත්කම්වල ආරම්භක ශේෂයේ ඇතුලත් රු.18,578,138 ක වත්කම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් සමන්විත කමිටු විසින් තක්සේරුකර ගිණුම්ගත කර තිබුණු නමුත් සමාන වත්කම්වල ඇගයීම්වලට අදාල රුපියල් වටිනාකම සම්බන්ධයෙන් පොදු නිර්නායකයන් අදාල කමිටු විසින් භාවිතා කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් භාණ්ඩාගාර කොම්ප්ට්‍රොලර් ජෙනරාල් වෙතද වාර්තා කර නොතිබුණි. | වත්කම් තක්සේරු කිරීමේදී පොදු නිර්නායකයන් සකස් කල යුතුවීම. | වත්කම්වල ආයුකාලය හා වර්තමාන තත්ත්වය සලකා කමිටුව විසින් වටිනාකම තීරණය කර ඇත. |
| (ඉ) දෙපාර්තමේන්තුව සතු විශ්‍රාම ශාලා 03 ක් සහ රථගාලක් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ වත්කම් නිවැරදිව ගිණුම් ගතකල යුතුවීම. | අදාල දේපල වල පිඹුරු/සැලසුම් හිමිකම් සහතික නොමැති බැවින් තක්සේරු කිරීමට නොහැකි වී ඇත. |

**1.6.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

---

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට වර්ෂ 05 ට වැඩි ණයගැති ශේෂය රු. 111,551 ක් වූ අතර වර්ෂ 2 ට හා වර්ෂ 1 ට වැඩි ණයගැති ශේෂ පිළිවෙලින් රු.311,640 ක් හා රු.501,585 ක් විය. | චක්‍රලේඛය ප්‍රකාරව ණය මාරු කිරීම් හා අයකිරීම් විධිමත් කළ යුතුවීම. | වසර 05 ට වැඩි ශේෂ කපා හැරීමට භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කර ඇත. අනෙක් ණය ශේෂවල වාරික අයවෙමින් පවතී. |

**1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

---

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) **ස්ථාවර වත්කම් ලේඛනය** | | |
| | 1978 දෙසැම්බර් 19 දිනැති අංක | එම ලේඛන සකස් |

| | | | |
|---|---|---|---|
| | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා 2009 සැප්තැම්බර් 01 දිනැති අංක DMA/2009 (2) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛන පවත්වා නොතිබුණු අතර ඉඩම් හා ගොඩනැගිලි වෙනුවෙන් සකස් කල ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය, 2009 සැප්තැම්බර් 01 දිනැති අංක DMA/2009 (2) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 502(2) හි 11 වැනි පරිශිෂ්ටය පරිදි ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගත යුතුවීම. | කරමින් පවතී. |
| (ආ) | **පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය**<br>----------------------------------------------<br>අංක IAI/2002/02 හා 2002 නොවැම්බර් 28 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව හඳුන්වා දී ඇති පෝරම සැපයුම්කරු සම්පූර්ණ කල බවට අත්සනක් හෝ නිල මුද්‍රාවක් තබා නොතිබුණු අවස්ථා විය. | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI//2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් හා අදාල පෝරම පවත්වා ගත යුතුවීම. | චක්‍රලේඛය ප්‍රකාරව එම පෝරම සැපයුම්කරු ලවා අත්සන් කර ගැනීමට කටයුතු කරමින් පවතී. |

### 1.6.5 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | නිරීක්ෂණය | නිර්දේශය | දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුවේ. එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | ඉදිරියේදී මේ අනුව කටයුතු කරනු ලැබේ. |

| | | |
|---|---|---|
| (ආ) වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍යා වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආස්ථිතායට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 3.6 ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණය හේතුවෙන් එම අවශ්‍යතා ඉටු කර නොතිබුණි. | - එම - | 2017 වර්ෂය සඳහා කාර්යසාධන වාර්තාව 2018 මැයි 31 දින අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. ඉදිරියේදී නියමිත දිනට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

**1.6.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ
අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

**නිරීක්ෂණය**

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (අ) මුදල් රෙගුලාසි 1647 | වාහන අළුත්වැඩියා, සේවා කිරීම්, ඉන්ධන පරීක්ෂාව හා වාහන අමතර කොටස් සම්බන්ධයෙන් ලොග් පොත්වල සටහන් කර යාවත්කාලීන කර නොතිබීම. | යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | මේ වන විට සියළුම වාහන වල ඉන්ධන පරීක්ෂා කර ලොග් සටහන්ද යාවත්කාලීන කර ඇත. |
| (ආ) මුදල් රෙගුලාසි 371 (2) සහ 2015 ජූලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | (i) මාණ්ඩලික නොවන නිලධාරීන් වෙත අවස්ථා 53 කදී රු.475,029 ක අත්තිකාරම් ලබාදී තිබීම. | යොමුගත රෙගුලාසිය හා චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | දැනට එම තත්ත්වය නිරවුල් වී ඇත. |
| | (ii) අවස්ථා 26 කදී ලබාගත් රු.297,934 ක අග්‍රිම පියවීමට දින 20 සිට 97 දක්වා කාල ප්‍රමාදයක් සිදුවීම. | - එම - | - එම - |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **ආදායම් කළමනාකරණය**

පහත සඳහන් නිරික්ෂණය කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට සංචාරක බංගලාවල නවාතැන් ගැනීම වෙනුවෙන් දෙපාර්තමේන්තුවට අයවිය යුතු මුළු හිඟ හිටි ආදායම රු.278,500 ක් විය. ඒ තුල වූ වර්ෂ 02 ත් 03 ත් අතර හිඟ හිටි ආදායම් ශේෂය රු.3,600 ක් වූ අතර වර්ෂ 03 ත් 04 ත් අතර හිඟ ආදායම් ශේෂය රු.151,500 ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කළ යුතුවීම. | ඉතිරි මුදල්ද අයකර ගැනීමට කටයුතු කරමින් සිටින බව දන්වමි. |

**2.2** **වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව හැකිතාක් සම්පූර්ණ හා නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල නොකිරීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයයන් 02 ක ඇස්තමේන්තු ගත මුළු ප්‍රතිපාදනයෙන් සියයට 40 කට වැඩි ප්‍රමාණයක් හෙවත් රු.1,834,852 ක් අදාල කාර්යයන් සඳහා වැය නොකර වෙනත් වැය විෂයයන් සඳහා මාරුකර තිබුණි. | හැකිතාක් නිවැරදි හා සම්පූර්ණ ඇස්තමේන්තු සකස් කළ යුතුවීම. | වාහන අපහරණය කිරීමට තීරණය කල බැවින් අළුත්වැඩියා සිදුකර නැති අතර, භාෂා ප්‍රතිපත්තියට අදාල ඉල්ලීම් නොමැති බැවින් ඉතිරිවූ ප්‍රතිපාදන මු.රෙ.66 න් මාරුකර ඇත. |
| (ආ) | ගොඩනැගිලි ඉදිකිරීම්, ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ මිලදී ගැනීම් සඳහා වාර්ෂික ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන වෙන්කර ගැනීමට කටයුතු නොකර මු.රෙ.66 මගින් රු.23,990,000 ක ප්‍රතිපාදන මාරු කර ගැනීම් සිදුකර තිබුණි. | හැකිතාක් නිවැරදිව වාර්ෂික ඇස්තමේන්තු සකස් කළ යුතුවීම. | ප්‍රතිපාදන ඉතිරිවේයැයි අපේක්ෂිත වැය විෂයයකින් මාරු කර ගන්නා ලෙස ලිඛිත උපදෙස් ලැබී ඇත. |
| (ඇ) | අවශ්‍යතා අනුව ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ලබා නොගෙන වැය විෂයයන් 05 ක් සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 30 කට වැඩි ප්‍රමාණයක් එනම් රු.5,388,333 ක් මු.රෙ.66 මාරු කිරීම් තුලින් ලබාගෙන තිබුණි. | - එම- | ඉදිරියේදී හැකිතාක් නිවැරදි ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඈ) | යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් | - එම - | ජාතික භෞතික නිර්මාණ |

| | | | |
|---|---|---|---|
| | වෙන්කළ මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.5,000,000 ක් වූ නමුත්, සමාලෝචිත වර්ෂයේදී ඉන් රු.359,850 ක් හෙවත් සියයට 7 ක් පමණක් වියදම් කර තිබුණි. | | සභාව කැඳවීමට නොහැකි වූ බැවින් අදාල සැලසුම් අනුමත කර ගැනීමට නොහැකි වීම හේතුවෙන් අදාල කාර්යයන් සිදුකර නොතිබුණු බව සහ ජාතික භෞතික සැලසුම අනුමත කරගෙන ඇති අතර ඉදිරි කටයුතු සිදුකරගෙන යනු ලැබේ. |
| (ඉ) | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වැඩි දියුණු කිරීම සඳහා 2018 වර්ෂයේදී රු.200,000 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයන් ලැබී තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසානයේදී රු.99,106 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 50 ක් ඉතිරිවී තිබුණි. | - එම - | ඉදිරියේදී හැකිතාක් නිවැරදි ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. |

**2.3** **බැරකම් හා බැඳීම්වලට එළඹීම**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ------------ | ---------------------- |
| (අ) | මු.රෙ.115 ප්‍රකාරව පූර්ව මුදල් වර්ෂයේ දෙසැම්බර් මාසය අවසානයේදී ගෙවිය යුතු වූ හිමිකම්පෑම් හැකි සෑම විටම අදාල වර්ෂයේ මාර්තු මාසය අවසාන වීමට මත්තෙන් ගෙවිය යුතු විය. එහෙත් කතරගම සංචාරක බංගලාව අළුත්වැඩියා කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුල පෞද්ගලික ආයතනයක් වෙත රු.2,138,284 ක් ගෙවිය යුතු වුවද 2019 අප්‍රේල් 30 දින වන විට ඒ වෙනුවෙන් රු.599,125 ක මුදලක් පමණක් ගෙවා තිබුණි. | බැඳීම්වලට එළඹීම හා ගෙවීම් කිරීම යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව සිදු කළ යුතුවීම. | මේ වන විට වියදම් ගෙවා අවසන් කර ඇත. |
| (ආ) | මු.රෙ.94(1) ප්‍රකාරව සලසා තිබුණු ප්‍රතිපාදන ඉක්මවා කිසියම් බැඳීමක් හෝ වියදමක් ඇතිකර නොගත යුතු වුවද 2018 වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් වැය විෂයයන් 09 ක් සඳහා ප්‍රතිපාදන ඉක්මවා රු.3,257,651 ක බැඳීම් ඇතිකර ගෙන තිබුණි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව වාර්ෂික වියදම් හා බැඳීම් ඇති කර ගත යුතුවීම. | 2018 වර්ෂයට අදාල වියදම් එම වර්ෂය තුලදීම දැරිය යුතුවීම හේතුවෙන් සීමා ඉක්මවා ඇත. |

**2.4 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| බිංගිරිය දේවගිරි රජමහා විහාරයේ සංවර්ධන සැලසුම් සකස් කිරීම සඳහා බුද්ධ ශාසන අමාත්‍යාංශයෙන් රු.550,000 ක්, එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ප්‍රදර්ශනය සඳහා මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙන් රු.1,000,000 ක් හා මෙත්සිත් අරණ වැඩසටහන සඳහා මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යංශයෙන් රු.2,766,223 ක් වශයෙන් දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබුණු එකතුව රු.4,316,223 ක මුදලින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට පිළිවෙලින් සියයට 81 ක් , සියයට 38 ක් හා සියයට 33 ක් ඉතිරිවී තිබුණි. | හැකිතාක් නිවැරදිව හා සම්පූර්ණව ඇස්තමේන්තු සකස් කළ යුතුවීම. | එම කාර්යන් අවසන් නොවීම නිසා ප්‍රතිපාදන ඉතිරි විය. ඉදිරියේදී එවැනි තත්ත්වයන් අවම කර ගැනීමට කටයුතු කරනු ලැබේ. |

**2.5 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) නියැදි පරීක්ෂාවට අනුව අවස්ථා 14 කදී, නිලධාරීන් වෙත ලබාදුන් පළමු අග්‍රිමය පියවීමට පෙර එකතුව රු.158,190 ක් වූ අග්‍රිම නැවත එම නිලධාරීන් වෙත ලබාදි තිබුණි. | අත්තිකාරම් පාලනය විධිමත් කළ යුතුවීම. | පළමු අග්‍රිමය පියවීමට පෙර නැවත අග්‍රිම ලබාදීම දැනට සිදු නොවේ. |
| (ආ) අත්තිකාරම් පියවීමේදී එම මුදල් වියදම් කල ආකාරය පිළිබඳ ලිඛිත සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය. | - එම - | බිල්පත් හා ලදුපත් නිසි පරිදි ලබාගෙන පියවීම කරයි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 දැක්ම හා මෙහෙවර**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ විෂය පථයට ඇතුළත් නොවූ පූජා භූමි නඩත්තු කටයුතු වෙනුවෙන් | දෙපාර්තමේන්තුවේ මෙහෙවර හා දැක්ම පදනම් කරගෙන | මෙම සේවකයින් බුද්ධ ශාසන අමාත්‍යාංශයට අනුයුක්ත |

| | | |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ සේවකයන් 158 කට වැඩි ප්‍රමාණයක් 2018 වසරේදී යොදවා තිබුණි. ඒ වෙනුවෙන් භාණ්ඩාගාරය විසින් වෙනම ප්‍රතිපාදන ලබාදීමක් සිදු නොකරන බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | කටයුතු කළ යුතුවීම. | කිරීමට සාකච්ඡා කරමින් පවතී. |

**3.2 සැලැසුම් කිරීම**

----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/1 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් විය යුතු සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ යෙදී සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර, වාර්ෂික අයවැය ක්‍රියාකාරකම්, කාල රාමුව හා අපේක්ෂිත නිමවුම අනුව ප්‍රමුඛතාවය මත පදනම්ව පිළියෙල කල ක්‍රියාකාරකම් සැලැස්ම, අග්‍රිම අවශ්‍යතා සැලැස්ම, ප්‍රධාන සංවර්ධන වැඩසටහන් සඳහා ප්‍රසම්පාදන සැලැස්ම හා අභ්‍යන්තර විගණන සැලැස්ම යනාදිය 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කර නොතිබුණි . | දෙපාර්තමේන්තුවේ කාර්යභාරයන් පිළිබඳව චක්‍රලේඛය ප්‍රකාරව විධිමත් සැලසුම් සකස් කළ යුතුවීම. | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මක් 2019 සඳහා සකස් කර ඇත. |
| (ආ) මහාභාණ්ඩාගාරයෙන් මෙම දෙපාර්තමේන්තුවට ලැබෙන ප්‍රතිපාදනවලට අමතරව වෙනත් ආයතනවලින් විවිධ ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ලැබෙන නමුත් දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්මට ඊට අදාල කාර්යයන් ඇතුළත් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ කාර්යභාරයන් පිළිබඳව චක්‍රලේඛය ප්‍රකාරව විධිමත් සැලසුම් සකස් කළ යුතුවීම. | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මක් 2019 සඳහා සකස් කර ඇත. |
| (ඇ) 2018 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවෙන් ගොඩනැගිලි ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා රු.1,000,000 ක ප්‍රතිපාදන සලසා තිබුණු නමුත් 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අදාල කාර්යයන් ඇතුළත් කර නොතිබුණි. | - එම - | - එම - |

**3.3 කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අනුරාධපුර පූජා භූමිය තුල ජනාවාස ව්‍යාප්තිය සීමා කිරීම, පුරා විද්‍යාත්මක ස්ථාන ආරක්ෂා කිරීම සහතික කිරීම, බැතිමතුන් සඳහා විශ්‍රාම ශාලා සංචාරක නිවාස පහසුකම් සැලසීම සහ දැනට මෙම ප්‍රදේශයේ පදිංචිව සිටින ජනතාවට නාගරික පහසුකම් සහිතව ජීවත්වීමට අවස්ථාව ලබාදීම යන අරමුණු වෙනුවෙන් අනුරාධපුර ලෝලුගස්වැව නව නගර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට 2006 වර්ෂයේ සිට අමාත්‍ය මණ්ඩල අනුමැතීන් ලබා ගෙන තිබුණි. ඒ අනුව 2016, 2017 හා 2018 වර්ෂයන්හි පිළිවෙලින් රු.මිලියන 100 ක්, රු.මිලියන 200 ක් හා රු.මිලියන 185 ක් වශයෙන් ප්‍රතිපාදන වෙන්කරවා ගෙන ව්‍යාපෘති කටයුතු සඳහා සැලසුම් සකස් කර තිබුණු නමුත් 2017 වර්ෂයේදී රු.මිලියන 05 ක් වියදම් කරමින් ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් සකස් කිරීම පමණක් සිදුකර තිබුණි. | ව්‍යාපෘති සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම කාර්යක්ෂම විය යුතුවීම. | ඉඩම වටා මැනීමේ කටයුතු සිදු කරමින් පවතී. |
| (ආ) | මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් මෙත්සිත් අරණ යටතේ ව්‍යාපෘති 05 ක් සඳහා රු.61,358,792 ක ප්‍රතිපාදන ලබාදී තිබුණද ඉන් කඳුබොඩ බවුන් සෙත් මානසික සුව සෙවණ භාවනා මධ්‍යස්ථානය ඉදිකිරීමේ කටයුතු විගණිත දින දක්වාම ආරම්භකර නොතිබුණි. | ව්‍යාපෘති සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම කාර්යක්ෂම විය යුතුවීම. | මෙත්සිත් අරණ ව්‍යාපෘතිය යටතේ කඳුබොඩ බවුන් සෙත් මධ්‍යස්ථානය සඳහා ප්‍රතිපාදන නොලැබුණු බැවින් මෙහි ඉදිකිරීම් ආරම්භ කිරීමට නොහැකි විය. |

**3.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2016 වර්ෂයේදී රු.34,602,321 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු ව්‍යාපෘති 04 ක කටයුතු දින 60 හා දින 120 ක කාලයක් තුල අවසන් කල යුතු වුවද 2018 දෙසැම්බර් අවසානය දක්වා එකඳු ඉදිකිරීමක හෝ වැඩ අවසන් කර නොතිබුණි. | ව්‍යාපෘති සැලසුම් සකස් කිරීම, ප්‍රතිපාදන වෙන්කර ගැනීම හා ක්‍රියාත්මක කිරීම කාර්යක්ෂම විය යුතුවීම. | ගම්පහ මාබිම තායි ශ්‍රී ලංකා බෞද්ධ මධ්‍යස්ථානයේ භාවනා කුටි ඉදිකර අවසන් කර ඇත. ඉඹුලකන්ද ශ්‍රී සම්බුද්ධ විහාරයේ ධර්ම මණ්ඩපයේ කටයුතු අවසන් කර ඇත. මුණ්ඩිගල ශ්‍රී සුමනගිරි ආරණ්‍ය |

| | | |
|---|---|---|
| | | සේනාසනයේ ඉදිකිරීම් කටයුතු අවසන් අදියරේ පවතී. දොඩන්ගොඩ ශ්‍රී සුබෝධි රජමහා විහාරයේ භාවනා කුටි ඉදිකිරීම් ව්‍යාපෘතිය අත්හරින ලදී. |
| (ආ) ඉහත සඳහන් කොන්ත්‍රාත් අධීක්ෂණ කටයුතු ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත පවරා තිබූ අතර ඒ සඳහා කොන්ත්‍රාත් මුදලින් සියයට 3 ක් දෙපාර්තමේන්තුව වෙත වෙන් කර තිබුණි. එහෙත් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම සඳහා කොන්ත්‍රාත්කරු විසින් කරන ලද ඉල්ලීම පිළිබඳ විධිමත් සොයා බැලීමකින් තොරව දින දීර්ඝ කිරීම් සිදුකර තිබුණි. | කොන්ත්‍රාත් අධීක්ෂණ කටයුතු විධිමත් කල යුතුවීම. | කොන්ත්‍රාත් සඳහා ගෙවූ අත්තිකාරම් අයකර ගැනීමේ ගැටළුව නිසා කාලය දීර්ඝ කර ඇත. |
| (ඇ) ව්‍යාපෘති සඳහා කොන්ත්‍රාත් භාරදීමේ ලිපි යැවීම, එම කොන්ත්‍රාත්තුව භාරගත් බවට ලිපි එවීම, අත්තිකාරම් ඉල්ලා සිටීම හා අත්තිකාරම් ලබාදීම යනාදිය සිදුවී ඇති දින වකවානුවල ප්‍රමාදයන් සලකා බැලීමේදී ව්‍යාපෘති ප්‍රමාදය සඳහා එම කාලයද සැලකිය යුතු ලෙස හේතුවී ඇති බව නිරීක්ෂණය විය. | කොන්ත්‍රාත් පරිපාලනය විධිමත් විය යුතුවීම. | අත්තිකාරම් සඳහා ඇපකර ලබා නොගන්නා නිසා වැඩ ආරම්භ කල පසු අත්තිකාරම් ලබාදීම සිදුකරන ලදී. |

**3.5** **අරමුදල් ඌන උපයෝජනය**

**------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ---------------------- | ------------ | ------------------------------- |
| මෙත්සිත් අරණ ව්‍යාපෘතිය සඳහා මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් 2016, 2017 හා 2018 වර්ෂ වලදී වෙන් කරන ලද ප්‍රතිපාදනවල ඉතිරිවීම් සියයට 67 සිට 91 දක්වා වූ පරාසයක විය. | ව්‍යාපෘති සැලසුම් සකස් කිරීම, ප්‍රතිපාදන වෙන්කර ගැනීම හා ක්‍රියාත්මක කිරීම කාර්යක්ෂම විය යුතුවීම. | කොන්ත්‍රාත්තුව භාරගත් ආයතනයේ නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම්, විශ්‍රාම යාම්, කාලගුණ බලපෑම් හා ඉදිකිරීම් සඳහා අමුද්‍රව්‍ය ප්‍රවාහනයේ දුෂ්කරතා යනාදී කරුණු මත ඉදිකිරීම් ප්‍රමාදවීම නිසා ප්‍රතිපාදන ඉතිරි විය. ඉදිරියේදී |

| | | |
|---|---|---|
| | | මෙවැනි තත්ත්වයන් අවම කර ගැනීමට කටයුතු කරනු ලැබේ. |

**3.6 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත එක් එක් වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවද 2014, 2015 හා 2016 වර්ෂයන්හි කාර්ය සාධන වාර්තාවන් පාර්ලිමේන්තුවේදී සභාගත කර තිබුණේ 2018 වර්ෂයේදීය. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | ඉදිරියේදී නියමිත දිනයන්ට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

**3.7 ප්‍රසම්පාදනයන්**

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) 2018 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව දෙපාර්තමේන්තුව වෙත මූලධන ප්‍රතිපාදන ලෙස රු.මිලියන 198.7 ක් වෙන්කර තිබුණද, දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම අනුව මූලධන ප්‍රතිපාදන අවශ්‍යතාවය රු.මිලියන 217.7 ක් විය. ඒ අනුව වාර්ෂික අනුමත ඇස්තමේන්තු මුදල ඉක්මවා රු.මිලියන 19 ක් ප්‍රසම්පාදන සැලසුමට ඇතුලත් කර තිබුණි. | වාර්ෂික ප්‍රසම්පාදන කටයුතු නිවැරදිව සැලසුම් කළ යුතුවීම. | ඉදිරියේදී ප්‍රසම්පාදන සැලැස්ම නිවැරදිව සකස් කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රසම්පාදන සැලැස්මේ ප්‍රගතිය පිළිබඳ වාර්තා සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන කටයුතුවල ප්‍රගතිය වාර්තා කළ යුතුවීම. | ප්‍රසම්පාදන සැලැස්මේ ප්‍රගතිය සකස් කරමින් පවතී. |
| (ඇ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ඡේදය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන | යොමුගත මාර්ගෝපදේශය අනුගමනය කළ යුතුවීම. | ප්‍රසම්පාදන සැලැස්ම ඒ අනුව සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| | කටයුතු ඇතුළත් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කල යුතු වුවද ඒ අනුව කටයුතුකර නොතිබුණි. | | |
| (ඇ) | ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර තිබූ රු.මිලියන 209 ක ප්‍රසම්පාදන කාර්යයන් 04 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඉටුකර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලසුමේ ඇතුළත් ඉලක්කයන් වෙත ළඟාවීමට අවශ්‍ය කටයුතු සිදුකල යුතුවීම. | ඉඩමේ හිමිකම නොලැබීම නිසා කාර්යයන් ඉටු කිරීම ප්‍රමාද විය. |
| (ඉ) | වාර්ෂික අයවැය ඇස්තමේන්තුවට ඇතුලත් වූ නමුත් ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් නොවූ වැය විෂයයන් 04 ක් වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් රු.10,049,985 ක වියදම් දරා තිබුණි. | විධිමත් පරිදි ප්‍රසම්පාදන සැලසුම් පිළියෙල කළ යුතුවීම. | 2019 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කර ඇත. |
| (ඊ) | කාර්යාලීය ලී බඩු උපකරණ මිලදී ගැනීමේදී ලී වර්ගය, ගුණත්වය හා වගකීම් කාලය සම්බන්ධයෙන් ඇගයීම් සිදු නොකර අවම මිල මත පදනම්ව පුද්ගලික සමාගමකින් 2018 වර්ෂයේදී රු.4,801,900 ක මිලදී ගැනීම් සිදුකර තිබුණි. | දෙපාර්තමේන්තුවේ අවශ්‍යතා අනුව නිවැරදි හා විස්තරාත්මක පිරිවිතර සකස් කිරීම හා ඇගයීම සිදු කළ යුතුවීම. | අවශ්‍යතා අනුව හැකිතාක්දුරට නිවැරදි හා විස්තරාත්මක පිරිවිතර සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. |

**3.8 පාඩු හා හානි**

--------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 වර්ෂයේ අනතුරට ලක්වූ අංක 57-9387 දරන වාහනය අළුත්වැඩියා කිරීම හෝ අපහරණය කිරීමට කටයුතු නොකර 2019 ජූනි මස වන විටත් විවිධ ආපදාවන්ට ලක්වෙමින් සෙත්සිරිපාය පරිශ්‍රයේ ගාල්කර තිබුණි. | පාඩු හා හානි අවම කිරීමට කටයුතු කළ යුතුවීම. | අංක 57-9387 දරන වාහනයේ අනතුර සිදුකිරීම සහ සොරකම සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මඟින් මූලික විමර්ශන කටයුතු සිදුකරමින් පවතී. එම විමර්ශන කටයුතු නිමවූ වහාම අපහරණ කටයුතු සිදුකිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. |

## 3.9 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුව සතු අංක 104 දරන නිල නිවාසය 2017 මැයි මස සිට භාවිතයට නොගැනීම නිසා වසර දෙකක කාලයක් දෙපාර්තමේන්තුව වෙත කිසිදු ආදායමක් ලැබී නොතිබුණු අතර අදාල නිවස, පාරිසරික අවදානම් වලට ලක්වෙමින් පැවතුණි. | දෙපාර්තමේන්තුව සතු වත්කම් පාලනය විධිමත් විය යුතුවීම. | මේ වන විට අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකුට ලබාදී ඇත. |
| (ආ) දෙපාර්තමේන්තුව සතු අංක 103 දරන නිල නිවසේ දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු පදිංචි වී සිටින නමුත් 2017 ජූලි 07 දිනෙන් පසුව නිල නිවාසය ලබාදීම වෙනුවෙන් අදාල නිලධාරියා සමග ගිවිසුම්ගතවී නොතිබුණි. | විධිමත් පරිදි ගිවිසුම්වලට එළඹිය යුතුවීම. | කලින් ගිවිසුම්ගතවී නොමැති බැවින් පසුව ගිවිසුම්ගතවී ඇත. |
| (ඇ) 2017 වර්ෂයේදී ධාවනයෙන් ඉවත් කල අංක C-3455, GJ-1531 හා KC-3369 දරන වාහන 2018 දෙසැම්බර් 31 දක්වා අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණු අතර එම වාහන රක්ෂණය සඳහා 2018 වර්ෂයේදී රු.50,431 ක් වැයකර තිබුණි. | දෙපාර්තමේන්තුව සතු වත්කම් විධිමත්ව පාලනය කළ යුතුවීම. | මේ වන විට එම වාහන උතුරු මැද පළාත් සභාවට පවරා දී ඇත. |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 367 ක්වූ අතර, තථ්‍ය කාර්යමණ්ඩලය 267 ක් වූයෙන් කාර්යමණ්ඩලයේ 100 ක පුරප්පාඩු පැවතිය අතර ඒ තුල ජ්‍යෙෂ්ඨ විධායක මට්ටමේ තනතුරු 37 ක් විය. | අතිරික්ත තනතුරු වේනම් එම තනතුරු අහෝසිකර ගත යුතු වීම. | පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අනුමැතියට යොමුකර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දෙපාර්තමේන්තුව විසින් එහි සේවයකල අනියම් සේවකයින් 29 දෙනෙකුට 2001 ජනවාරි 31 දින රු.1,080,882 ක වන්දි මුදල් ගෙවා තිබුණි. තවද දේශපාලන හේතු මත විවිධ ගැටළුවලට මුහුණ දුන් අයට සහන සැලසීම නමින් තවත් රු.1,600,000 ක වන්දි මුදලක් ගෙවා තිබුණි. රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය විසින් පත්කල කමිටුව මගින් යථෝක්ත සේවකයින්ට දේශපාලන පලිගැනීමක් නිරීක්ෂණය නොවන බව සඳහන්ව තිබියදීත් සානුකම්පිතව සලකා වන්දි මුදල් ලබා දීමට තීරණය කර තිබුණි. | මානව සම්පත් කළමනාකරණය විධිමත් කළ යුතුවීම. | දේශපාලන හේතු මත විවිධ ගැටළුවලට මුහුණ දුන් අය සඳහා විමර්ශනය කිරීමට පත්කළ කමිටුව විසින් ලබාදී ඇති නිර්දේශ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති බැවින් එම තීරණය පරිදි ගෙවීම් කටයුතු සිදුකර ඇත. |